# නර්තනය (පෙරදිග)

# 08 ශ්‍රේණිය

## කාර්ය පත්‍රිකා සංග්‍රහය



## කලාප අධ්‍යාපන කාර්යාලය
## අම්පාර

නර්තනය

8 ශ්‍රේණිය.    111 - වාරය

ගුරුභවතාගේ නම : H.M. නදීකා ශිරෝමි    අම්/සේනාගම මහ විද්‍යාලය

නිපුණතාව : 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම : 6.2 වෙනත් සංස්කෘතීන්වලට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි.

## භරත නාට්‍යම් සම්ප්‍රදාය

ශ්‍රී ලංකාව ද ඈත අතීතයේ සිටම භාරතය සමග සමීප සබඳතාවන් පවත්වා ඇත. එසේ හෙයින් ඉන්දියානු සම්භවයක් සහිත එකී සංස්කෘතියෙන් පෝෂණය වූ ජන කොටස් උතුරු නැගෙනහිර පළාත් වල බහුල වශයෙන් ද, අනෙකුත් ප්‍රදේශවල නගරාසන්නව ද, වතුකරයේ ද ජීවත් වෙති. ශ්‍රී ලාංකේය ප්‍රජාවෙහි එක් ජන කොටසක් ලෙස සලකන මෙකී ප්‍රජාව ද්‍රවිඩයන් ලෙස හඳුන්වන අතර , ඔවුන් සතු නර්තන ක්‍රමය “භරත නාට්‍යම්” ලෙස හඳුන්වති.

මෙකී නර්තන ක්‍රමය අද්‍යතන වන විට ද්‍රවිඩ ප්‍රජාව අතර පමණක් නොව සිංහල ප්‍රජාව අතරද ව්‍යාප්ත වී ඇත. එසේ හෙයින් “භරත නාට්‍යම්” නමින් හඳුන්වනු ලබන නර්තන ක්‍රමය පිළිබඳව තොරතුරු විමසා බැලීම මෙම පාඩමෙන් අරමුණු කෙරේ.

### ප්‍රචලිත ප්‍රදේශ

- නිජබිම :- දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තය
- ආන්ද්‍රා , කේරළ , කර්ණාටක , මහාරාෂ්ට , මද්‍රාසිය

### ආගමික සබඳතා






- මෙය දකුණු ඉන්දියානු හින්දු දේවාලයන්හි දෙවියන් ඉදිරියෙහි නර්තනය කිරීම සඳහා යොදා ගන්නා ලද්දකි. එකී දෙවියන්ට පූජා පිණිස දේවාලවල සේවය කළ “දේවදාසී” නම් ස්ත්‍රීන් විසින් මෙම නර්තන ක්‍රමය රඟ දක්වන ලද නිසා “දාසි ආට්ටම්” නමින්ද හඳුන්වා ඇත.

### ඓතිහාසික පසුබිම

- භරත මුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව රඟ දක්වන නිසා මෙය භරත නැටුම වේ.
- භාව රාග තාල යනුවෙන් මෙකී අන්තර් ගතය ගොඩ නැගී ඇති නිසා එම වචන තුනෙහි මුල් අක්ෂර තුන එකතු වීමෙන් භරත වූ බව.

### සංගීතය හා වාදන භාණ්ඩ

- දක්ෂින භාරතීය කර්ණාටක සංගීතය

මෘදංගය    නටුවාංගම්    වීනාව    වයලීනය

බටනලාව

- නටුවාංගම් වාදනය කරනු ලබන්නේ නටුවනාර්(ගුරුවරයා) විසිනි.


<u>අධ්‍යාපන ආයතන</u>


- අඩියාර් හි කලා ක්ෂේත්‍ර
- මෙහි ආරම්භකයා වූයේ රුක්මණී දේවි අරුන්ඩේල් ශිල්පිණියයි.

නර්තන අංග

- ආලාරිප්පු
- ජතීස්වරම්
- ශබ්දම්
- වර්ණම්
- පදම්
- තිත්ලානා
- ශ්ලෝකම්

රංග වස්ත්‍රාභරණ






කාන්තා රංග වස්ත්‍රාභරණ කට්ටලය ආකාර තුනකින් යුක්ත වේ.


සාරි උඩෙයි



පිජාමා උඩෙයි



පාවාඩ දාවනී උඩෙයි



අංග රචනය

- උප්පනෙයි යනුවෙන් හැඳින්වේ.

අංග රචනය


- සරල ස්වාභාවික අංග රචනයක් යොදා ගනී. මුහුණ පැහැපත් කරන වර්ණාලේප ගල්වා ඇහි බැම සරසා නළලේ තිලකලයි. පුරුෂයින් නළලේහි සුදු පැහැති ඉරි යොදා ඇහි බැම ඇඳ , ඇහි බැම දෙකට මැදින් නළලෙහි තිලකලති.

නර්තනයට දායක වූ අය

- තාන්ජාවූර් සහෝදරයෝ
- මීනාක්ෂි සුන්දරම්පිල්ලෙයි
- මාලා සරස්වතී
- රුක්මනි දේවි අරුන්ඩේල්
- අම්ලා දේවි
- ශ්‍රීමතී ශාන්තා



චින්නයියා , පොන්නයියා , ශිවනාදන් , වඩිවේළු) මීනාක්ෂි සුන්දරම්පිල්ලෙයි



රුක්මණී දේවි අරුන්ඩේල්



බාලා සරස්වතී

අරංගේත්‍රම් සංදර්ශනය

උඩරට නර්තන සම්ප්‍රදායේ නැටුම් ශිල්පය හදාරා හිසවෙස් බඳින මංගල්‍යය කලඑළි මංගල්‍යය වේ. එසේම භරත නිළියකගේ එම අවස්ථාව අරංගේත්‍රම් නම් වේ. එදින වේදිකාව මත ශිව දෙවියන් වඩා හිඳුවා නියමිත වතාවත් කරයි. එතෙක් නවක නිළිය වැඳගෙන හිඳී පූසාරි විසින් දෙන ළද පහන් වැටි අත ගා ඒවාට වැඳීමෙන් අනතුරුව ගුරුවරයා අතින් නැකතට ගෙජ්ජි පොකුර ලබා ගනී. පසුව දෙමාපියන්ට ගෙජ්ජි පොකුර දී වැඳීමෙන් අනතුරුව එය තමා විසින් බැඳ ගනී. ගුරුවරයා අතින් විශේෂයෙන් සිදුවනුයේ නවක නිළියකගේ නළලේ තිලකය තැබීමයි. ඉන් පසු ගුරුවරයාට වැඳ ඇගේ සංදර්ශනය කරයි.

## කාර්ය පත්‍රිකාව

1. භරත නාට්‍යම් සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස,

   1. තමිල්නාඩුව, තාන්ජෝරය, ඩෙකෑන්, මදුරාසිය,
   2. තාන්ජෝරය, ඩෙකෑන්, මදුරාසිය,දිල්ලිය
   3. මදුරාසිය, දිල්ලිය, කල්කටා, චෙන්නයි
   4. ලක්නව්, ජායිපූර්, බෙනාරිස්, දිල්ලි

2.“භරත යන ”..........

   1. භාරතයේ නිර්මාණය වීම යන්නයි.
   2. භාව රාග තාල යන්න එකතු වීමෙන් නිර්මාණය වීම
   3. භගවත් ගීතාවෙන් නිර්මාණය වීමයි
   4. දකුණු ඉන්දියාවේ නිර්මාණය වීමයි

3.භරත නාට්‍යම් ලෙස හඳුන්වන්නේ,...........

   1. කර්ණාටක සංගීතය ඇතුලත් නිසා
   2. දකුණු ඉන්දියාවේ ප්‍රචලිත නිසා
   3. ක්‍රිෂ්ණ දෙවියන්ගේ කතා පුවත් ඇතුලත් නිසා
   4. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ එන නෘත නෘත්‍ය නාට්‍ය අංග නිසා

4. අතීතයේ දී දෙවියන් පිනවීම සඳහා දේවාල වල නර්තන කළ කාන්තාවන් හැඳින්වූයේ,

   1. නිළියන් ලෙස 2. අංගනාවන් ලෙස
   3. දේවදාසීන් ලෙස 4. ආලත්ති අම්මාවරු ලෙස

5. භරත නාට්‍යම් හි සංගීත සම්ප්‍රදාය වනුයේ ,

   1. දක්ෂිණ භාරතීය කර්නාටක සංගීත 2. උත්තර භාරතීය හින්දුස්ථානි සංගීතය
   3. දක්ෂිණ භාරතීය හින්දුස්ථානි සගීතය 4. උත්තර භාරතීය බටහිර සංගීතය

6. භරත නාට්‍යම් හි ගැයුම්, වැයුම් යන අංගයන් හි දැනුම ඇති ගුරුවරයා හඳුන්වන නාමය වනුයේ,

   1. ශිංකිඩි 2. පොන්නානි 3. කදුකාරම් 4. නට්ටුවනාර්

7. භරත නාට්‍යම් සංදර්ශනයක් වර්තමානයේ තිබෙන තත්වයට සංවර්ධනය කිරීමේ ගෞරවය.

   1. තාන්ජාවූර් සොහොයුරන්ට 2. මීනක්ෂි සුන්දරම් පිල්ලෙට
   3. වල්ලතෝල් නාරායණ් මෙනන්ට 4. රබීන්ද්‍රනාත් තාගෝර් තුමාට

8. භරත නාට්‍යම් සම්ප්‍රදාය උගන්වන ආයතනයකි.

   1. අඩියාර් හි කලා ක්ෂේත්‍රම් 2. ශාන්ති නිකේතනය
   3. භාත්ඛණ්ඩ විශ්ව විද්‍යාලය 3. කේරළ කලා මණ්ඩලම්

9. භරත නට්‍යම් සම්ප්‍රදායේ ...................................... එහි ප්‍රධාන අවනද්ධ භාණ්ඩයයි.

10. භරත නාට්‍යම් හි සංගීතඥයෝ ............................ ලෙස හැඳින්වෙති

11. සතර අභිනය වඩාත් පොහොසත් නර්තන සම්ප්‍රදාය ලෙස භරත නාට්‍යම් සම්ප්‍රදාය හැඳින්විය හැක.උදාහරණ සහිතව පහදන්න.

12. භරත නාට්‍යම් සම්ප්‍රදාය ඇතිවීමේ ලා බලපෑ ආගමික පසුබිම විස්තර කරන්න.

13. භරත නාට්‍යම් සංදර්ශනයක නර්තන අංග පිළිවෙලින් නම් කර ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

14. භරත නාට්‍යම් සංදර්ශනයක නර්තන අංග අනුපිළිවෙලට සකස් කළ තාන්ජාවූර් සහොයුරන් නම් කර ඔවුන් පිළිබඳ ඇගයීමක් කරන්න.

15. භරත නාට්‍යම් සම්ප්‍රදායේ වාද්‍ය භාණ්ඩය නම් කර ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න.

නර්තනය

8 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : ඩී. ඩී.එස්.පුෂ්පලතා. අම්/ බණ්ඩාරනායක බා. ජා.පා.

නිපුණතාව : 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම : 7.1, 7.2 නිර්දේශිත ගීතයට සවන් දී සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි.

## නර්තන නිර්මාණ සඳහා උචිත නිර්දේශිත ගීත හඳුනා ගනිමු

ගීත අනුව නර්තන නිර්මාණය කිරීම අද්‍යතන ප්‍රසංග කලාවන් හි බහුලව දක්නට ලැබෙන්නකි. එබැවින් එම ගීතවල තාල , නාද රටාව අවබෝධ කරගෙන ගීත ගායනය කිරීම හා නර්තන ඉදිරිපත් කිරීම සිදු කරයි.

### දීකිරි දීකිරි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි
මිහිපිට කාටත් ගුණ දෙන දීකිරි...//

පැටියා මෝරපු දෙණ ගෙන් ගත් කිරි
හොඳ හැටි උණු කොට හින්දාගත් කිරි
නැවුම් මුට්ටියේ වත්කල මේ කිරි
පණාමට ලාබයි මං දෙන මේ කිරි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

කිරි විකුණාලා කාසි හොයන්නයි
අනාගතේ මාළිගා තනන්නයි
කුමාරයෙක් ගෙදරට කැන්දන්නයි
මුට්ටිය බිඳුනොත් ඔක්කොම ඉවරයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....

හිස මගේ දෙදරයි දෙපා රුදා දෙයි
රෑ වෙන්නට පෙර ගෙදරට යන්නයි
පණාමේ කිරි ගෙන පිහිටක් වෙන්නයි
මගේ මංගල්ලෙට ඔහෙලත් එන්නයි

දීකිරි දීකිරි ගෙනාව දීකිරි....///

ගායනය : අනුලා බුලත්සිංහල

ගී පද රචනය - ලූෂන් බුලත්සිංහල

සංගීතය. - ඔස්ටන් මුණසිංහ

ගායනය. - අනුලා බුලත්සිංහල



- මෙම ගීතය ඇතුළත් වී ඇත්තේ ලූෂන් බුලත්සිංහල ගුරුන් විසින් අධ්‍යක්ෂණය කරන ලද රතු හැට්ටකාරි නාට්‍යයේ ය. මෙය ගැමි ජනතාවගේ ජීවන වෘත්තිය තේමා කරගත් ගීතයකි.

## රත්නදීප ජන්ම භූමි.....

ගී පද රචනය : මහගම සේකර

සංගීත රටා : පණ්ඩිත් අමරදේව

ගායනය : පණ්ඩිත් අමරදේව

(රත්නදීප ජන්ම භූමි ලංකාදීප විජය භූමි)//
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි


ආදි සිංහලේ වීර මීමුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි

(මානික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී) // ඇත්තෙ එ අතීත දූ පුතුන්
(ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ)// ජීවිතේ පුදා හෙලූ ලේ කඳයි

(සින්දූපමාන වැව් තලා මතින් ඇදී)// පද්ම රේණුයෙන් සුගන්ධ වී
(රන් කරල් නමා හමා සිත් ප්‍රබෝධයෙන් පුරා)//
එන්නෙ උන් හෙලූ ප්‍රාණ වායුවයි

(ගංගා තරංග රාව දී රිදී වනින්)// මල් පිපී තුලෙන් තුළේ හැපී
(ගායනා කරන්නේ ආකාසයේ නැගී)// වීරයින්ගෙ එ යශෝ ගීතයයි

(රත්නදීප ජන්ම භූමි ලංකාදීප විජය භූමි)//
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි
ආදි සිංහලේ වීර මීමුතුන් ලෙයින්
සාර වූ උදාර වූ මාතෘ භූමියයි - මාතෘ භූමියයි



- සිංහල ජනතාවගේ උදාරතර මාතෘ භූමිය වූ ශ්‍රී ලංකාද්වීපයේ ස්වභාව සෞන්දර්ය වර්ණනා කරමින් එය ආරක්ෂා කර ගැනීමට කැපවූ සිංහල වීරයන් සිහිපත් කිරීම තේමාකොට ගත් දේශාභිමාන ගීතයකි.
- දුවේ පුතේ මෙම ගීත දෙකම අන්තර්ජාලය ආධාර කරගෙන හොඳින් ශ්‍රවණය කරන්න.
- එම ගීතයන් ගේ තාල රටාව සිහියට නගාගෙන කිහිප වරක් ගායනා කරන්න.
- නර්තන නිර්මාණය කිරීමේ දී රිද්මයානුකූල චලන, තාලානුකූල චලන, ප්‍රකාශනාත්මක චලන ආදී චලනයන්ගෙන් ඔබ කැමති චලන යොදා ගනිමින් නර්තන නිර්මාණය කළ හැකිය.

## කාර්ය පත්‍රිකාව

➢ දීකිරි දීකිරි ගීතයෙන් ප්‍රශ්න

1. මෙම ගීතය රචනා කලේ කවුද?
2. මෙම ගීතය කවුරුන් විසින් ගායනා කරන ලද්දක් ද?
3. මෙම ගීතයේ සංගීත නිර්මාණය කලේ කවුද ?
4. දීකිරි දීකිරි ගීතය ඇතුළත් වී ඇත්තේ කුමන නාට්‍යයේ ද?
5. මෙම ගීතය ගායනා කරන ලද තාලය කුමක්ද ?
6. මෙම ගීතයේ අර්ථය කෙටියෙන් විස්තර කරන්න.
7. මෙම ගීතය සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.
8. මෙම ගීතය අදහස ඉදිරිපත් වන අන්දමින් සුන්දර නර්තනයක් ඉදිරිපත් කරන්න.

➢ රත්න දීප ජන්ම භූමි ගීතය ප්‍රශ්න

9. රත්න දීප ජන්ම භූමි ගීතයේ පද රචනය කරන ලද්දේ කවුරුන් විසින්ද ?
10. මෙම ගීතය ගායනා කරන ලද්දේ කවුරුන් විසින්ද?
11. මෙහි සංගීත නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?
12. මෙම ගීතයෙන් ශ්‍රී ලංකාද්වීපයේ ස්වභාව සෞන්දර්ය වර්ණනා කිරීමට කවි පද රචකයා ගත් උත්සාහය කෙබඳු දැයි විස්තරයක් කරන්න.
13. මෙම ගීතය ගායනා කරන ලද තාල රූපය කුමක්ද?
14. එම තාල රූපය අවබෝධ කරගෙන එම ගීත ගායනා කරන්න.
15. සිංහල ජනතාවගේ උදාරතර මාතෘ භූමියේ සුන්දරත්වය ප්‍රේක්ෂකයාගේ හදවතට නැගෙන අයුරින් නර්තනයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.